ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය
முதலீட்டு மேம்பாட்டு அமைச்சு
MINISTRY OF INVESTMENT PROMOTION

කාර්යසාධන වාර්තාව
செயலாற்றுகை அறிக்கை
Performance Report
2022





කාර්යසාධන වාර්තාව - 2022

ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

ඇමුණුම I

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය - 187

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 – කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07– අනුකූලතා වාර්තාව

ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

2022.07.22 දිනැති අංක 2289/43 දරන අති විශේෂ ගැසට් පත්‍රය හා 2022.09.16 දිනැති අංක 2297/78 දරන අති විශේෂ ගැසට් පත්‍ර වලට අනුව ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ස්ථාපිත කර ඇත.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ශ්‍රී ලංකාව කලාපයේ වඩාත් තිරසර ආයෝජන ගමනාන්තය බවට පත් කිරීම.

මෙහෙවර

අගය එකතු කළ අපනයන පදනමකට සහ තිරසර ආයෝජනය ආකර්ෂණය කර ගනිමින්, ගුණාත්මක සමාජ ආර්ථික සංවර්ධනයක් ශ්‍රී ලංකාව තුල ඇති කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

1. රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ආයෝජන ප්‍රවර්ධන විෂයයට සහ අමාත්‍යාංශය යටතේ ඇති විෂය පථයට අයත්වන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන, ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම.

3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.

4. ශ්‍රී ලංකාව කලාපීය වෙළඳ හා ආයෝජන සහයෝගීතාවය ඉහළ නැංවීම අරමුණු කරගත් ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය.

5. ශ්‍රී ලංකාව තුල ආර්ථික විභවතාව ප්‍රවර්ධනය කරමින් විදේශීය සෘජු ආයෝජන සහ පුද්ගලික අංශයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම.

6. ආර්ථික සංවර්ධන කලාප ප්‍රවර්ධනය, නියාමනය සහ අධීක්ෂණය.

7. ජාතික යහපත සහ ආර්ථික දියුණුව අරමුණු කරගෙන විශේෂිත යටිතල සහ අනෙකුත් පහසුකම් සහිත ජාත්‍යන්තර ව්‍යාපාර හා සේවා කේන්ද්‍රස්ථානයක් වශයෙන් කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපය සංවර්ධනය කිරීම.

8. කොළඹ නෙළුම් කුලුන ව්‍යාපාර මොඩලයක් බවට පත්කර සංචාරක මධ්‍යස්ථානයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම.

9. තාක්ෂණ උද්‍යාන ඇති කිරීම.

10. ඩිජිටල් තාක්ෂණ ව්‍යාපාර පුළුල් කිරීම සම්බන්ධ කටයුතු.

1.4 සංවිධාන සටහන

ඇමුණුම 02න් දක්වා ඇත.

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

1. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
3. කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව
4. කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය
5. තාක්ෂණ උද්‍යානය
6. කලම්බු ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්
7. තොරතුරු තාක්ෂණ උද්‍යාන

02 පරිච්ඡේදය – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ, ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

<u>විශේෂ ජයග්‍රහණ</u>

1. ආයෝජක පහසුකරන කේන්ද්‍රය (IFC) පිහිටුවීම
   රටට අවශ්‍ය විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා කාල ප්‍රමාදයන් සහ අනෙකුත් අභ්‍යන්තර හා බාහිර පරිපාලන දුර්වලතා මඟහරවා ගනිමින් රේඛීය නියෝජිත ආයතන මඟින් අනුමත කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සහ පහසු කිරීම සඳහා එක් ස්ථානයක් (Single Window Platform) පිහිටුවීමේ අරමුණින්, "ආයෝජක පහසුකරන කේන්ද්‍රය (IFC)" නම් වූ විශේෂ ඒකකයක් ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය තුල ස්ථාපිත කරන ලදී.
2. ආයෝජකයන් සඳහා දිගු කාලීන පදිංචි වීසා නිකුත් කිරීම.
   ඔප්පු කරන ලද වාර්තා සහිත දිගු කාලීනව රට තුල ආයෝජනය කළ ආයෝජකයන් සඳහා බාධාවකින් තොරව සහ පහසු සේවාවක් සැපයීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් පස් අවුරුදු පදිංචි වීසා වැඩසටහනක් ආරම්භ කරන ලදී.
3. 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ 2022 අංක 01 දරන බලයලත් තැනැත්තා ලියාපදිංචි කිරීම හා බලය ලබා දීම (ගාස්තු) නියෝග ගැසට් පත්‍රයේ පළ කර ඇති අතර පාර්ලිමේන්තු අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.
4. 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ 2022 අංක 01 දරන බලයලත් තැනැත්තන් ලියාපදිංචි කිරීමේ, බලපත්කරණ, බලය පැවරීමේ හා සෙසු අනුමැතීන් සඳහා වූ නියෝග ගැසට් පත්‍රයේ පළ කර ඇති අතර පාර්ලිමේන්තු අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

අභියෝග

1. ත්‍රෛපාර්ශවික ගිවිසුමේ සඳහන් ශ්‍රී ලංකා රජයේ බැඳුම අනුව වරාය නගර ව්‍යාපෘතිය පිටත උපයෝගීතා සේවා හා යටිතල පහසුකම් කටයුතු අඛණ්ඩව සිදු කිරීම සඳහා ප්‍රතිපාදන සපයා ගැනීම.
2. එවක තාක්ෂණ අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද තාක්ෂණ උද්‍යාන 05කින් තාක්ෂණ උද්‍යාන දෙකක ඉදිකිරීම් කටයුතු දැනටමත් ආරම්භ කර ඇත. ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම.
   (ගාල්ල දිස්ත්‍රික්කයේ වලහන්දුවේ, වලහන්දුව වත්ත සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ රත්ගල්ල පාළුකුඹල්පොළ) ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත.

ඉදිරි ඉලක්ක

1. පොරොන්දු වූ ස්ථාවර සෘජු ආයෝජන ඇ.ඩො.මිලි. 2700 ලබා ගැනීම.
2. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සමාගම් විසින් ඇ.ඩො.මිලි 10,400ක වෙළඳ භාණ්ඩ අපනයනය කිරීම.
3. වෙළඳ භාණ්ඩ අපනයනයෙන් ඩොලර් බිලියන 14.8ක් සහ සේවා අපනයනයෙන් ඩොලර් බිලියන 4.2ක් උපයා ගැනීම.
4. 2023 වන විට නෙළුම් කුලුනේ වර්ග අඩි 115,011කින් යුත් කුටි 46 ක් කුලී පදනම් මත ලබා දී ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීම.
5. වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ,
   i. කිලෝ වොට් 220ක විදුලි සැපයුම් මාර්ගය (ක්‍රියාත්මක කිරීමේ ආයතනය - ලංකා විදුලිබල මණ්ඩලය)
   ii. පානීය ජල මාර්ග (ක්‍රියාත්මක කිරීමේ ආයතනය - ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය)
   iii. උතුරු හා දක්ෂිණ මලාපවහන මාර්ග (ක්‍රියාත්මක කිරීමේ ආයතනය - කොළඹ මහ නගර සභාව, අයවැය ප්‍රතිපාදන ව්‍යාපෘති කළමනාකරණ ඒකකය යටතේ)
   iv. කුලුනු මතින් දිවෙන වරාය පිවිසුම් මාර්ගය ඇතුළු මාර්ග ප්‍රවේශ ඉදිකිරීම් (ක්‍රියාත්මක කිරීමේ ආයතනය - මාර්ග සංවර්ධන අධිකාරිය) සකස් කිරීම

ප්‍ර.ග.නි. / ග.නි/ ආයතන ප්‍රධානියා විසින් අත්සන් කළ යුතු ය.

.....

දිනය

2023/2/28

03 පරිච්ඡේදය - 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහාවන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ-එෆ්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	තක්සා 2022 රු.	2021 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4			
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		101,925,000	-	ඒසිඒ-3
-	තැන්පතු		250,254,885	-	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		12,862,238	-	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්				
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**365,042,124**	-	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**365,042,124**	-	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**365,042,124**	-	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
52,500,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	43,522,326	-	
84,510,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	72,388,040	-	ඒසිඒ-2(ii)
430,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	462,078	-	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
137,440,000.00	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**116,372,444**	-	
	මූලධන වියදම්				
2,060,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	901,913	-	
4,800,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	3,632,510	-	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
300,000.00	හැකියා වර්ධනය	14	198,499	-	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
7,160,000.00	**මුළු මූලධන වියදම් (උ)**		**4,732,922**	-	
	තැන්පතු ගෙවීම්		250,897,053	-	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		31,143,964	-	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		282,041,018	-	
144,600,000	**මුළු වියදම් එ = (ඊ+උ+ඌ)**		403,146,383	-	
(144,600,000)	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(38,104,260)	-	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(38,104,260)	-	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිඒ-3
			-	-	

1

2023/02/24

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පි

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තක්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	55,068,804	-
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	18,281,726	-
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**73,350,530**	-
ශුද්ධ වත්කම් / ස්කන්ධය		-	
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		18,011,216	-
දේපළ පිරියත හා උපකරණ සංචිතය		55,068,804	-
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**	-	
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	270,510	-
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**73,350,530**	-

පිටු අංක 7 සිට 33 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 34 සිට 63 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගිණුම්දීමේ නිලධාරි
නම :එම්.එම්.නයිමුදීන්
තනතුර : ලේකම්
දිනය :2023.02.

.....
ප්‍රධාන ගණකාධිකාරි
නම :සී.ඩී.වීරසිංහ

දිනය :2023.02. 24

3.3 මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2022 රු.	2021 රු.
	කඩා	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	411,378	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්		-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	2,259,331	-
අග්‍රිම ලැබීම්	101,925,000	-
අත්තිකාරම් අයකර ගැනීම්	9,737,032	-
තැන්පතු ලැබීම්	250,254,885	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**364,587,627**	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	101,339,435	-
සහනාධාර සහ මාරුකිරීම්	464,545	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	183,278	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	9,055,872	-
තැන්පතු ගෙවීම්	250,897,053	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**361,940,185**	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**2,647,442**	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	2,647,442	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**2,647,442**	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(2,647,442)**	-
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) +	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

2023/02/24

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

1. වාර්තාකරණ කාලපරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. මිණුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත.අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදු කරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

1. ආදායම් හඳුනා ගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාල සීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනා ගනු ලැබේ.

2. දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථා වලදී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

3. දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිතගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

4. මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
-	-	-	-	-	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	137,440,000.00	137,440,000.00	116,372,444.00	84.67
ප්‍රාග්ධන	7,160,000.00	7,160,000.00	4,732,922.00	66

3.7 මු.රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
-	-	-	-	-	-	-

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2022** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.)	**31.12.2022** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.)	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ	55,068,804.29	55,068,804.29	-	100
9153	ඉඩම්				
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. TIP/B/MIP/FA/2022/02
ඔබේ අංකය உமது இல. Your No.
දිනය திகதி Date 2023 මැයි 25 දින

ලේකම්
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

ශීර්ෂය 187 - ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 187 - ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 23 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.5.1 මූලධන වියදම්

ACA-C ආකෘතිය ප්‍රකාරව පිළියෙළ කර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස එක් එක් වැය ශීර්ෂයන්ට අදාළ වටිනාකම රු.411,378ක් වූ අධිභාර ශේෂයන් වෙනමම අධිභාර ලෙස හඳුනා තිබුණි.

1.5.2 තැන්පතු ගිණුම් ශේෂ

ACA-4 ආකෘතිය ප්‍රකාරව පිළියෙළ කර ඇති 2022 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශයේ 2022 ජනවාරි 01 දිනට ශේෂය ලෙස රු.912,678ක් හඳුනා ගෙන තිබුණි. රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමණාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර කටයුතු අංශය 2022 ඔක්තෝබර් 01 දින සිට නව අමාත්‍යාංශයක් ලෙස මෙම අමාත්‍යාංශය පිහිටුවා ඇති බැවින් පැරණි අමාත්‍යාංශයට අදාළව රු.912,678ක තැන්පත් ශේෂයක් මෙම අමාත්‍යාංශයේ ආරම්භක ශේෂය ලෙස හඳුනා ගෙන ඇති නමුත් එය තැන්පත් ලැබීමක් ලෙස භාණ්ඩාගාර පොත් වල හඳුනා ගෙන තිබුණි. එම නිසා, ACA-F ආකෘතිය ප්‍රකාරව පිළියෙළ කර ඇති මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් ලෙස හඳුනා ගෙන ඇති තැන්පතු ලැබීම් රු.912,678ක් අඩුවෙන් ඇතුළත් කර තිබුණි. තවද,

ACA-7 ආකෘතිය ප්‍රකාරව පිළියෙළ කර ඇති අග්‍රිම සැසඳුම් ප්‍රකාශයද එම වටිනාකමෙන් අධිගණනය වී තිබුණි.

1.5.3 ලේඛන හා පොත්පත් පවත්වා නොකිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

ලේඛන වර්ගය		අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
(අ)	ඇප ලේඛනය	මු.රෙ.891 (1)	මු.රෙ.891 (1) හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වුවද් එසේ පවත්වාගෙන නොතිබුණි.
(ආ)	සම්මත ණය ලේඛනය (සී. සී. 10)	සම්මත ණය ලේඛනයෙහි උපදෙස්	සම්මත ණය ලේඛනය (සී.සී 10), සම්මත ණය ලේඛනය පවත්වා ගෙන යා යුතු උපදෙස් අනුව පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ඇ)	අතිකාල වැඩ ලේඛනය	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 19/89	අතිකාල සඳහා වෙන්වූ නියමිත ආකෘතිය ප්‍රකාරව අතිකාල වැඩ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.
(ඈ)	ණය පාලන ගිණුම	සාමාජික ණය පාලන ගිණුම පවත්වාගෙන යාමේ උපදෙස් මාලාව	ණය පාලන ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2020 අගෝස්තු 28 දිනැති 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 11.1 ඡේදය අනුව මු.රෙ.756 (6)	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකර අවසන් කිරීමේ කාල රාමුව අනුව කටයුතු කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය (i) මුදල් රෙගුලාසි 880	මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදාහැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුතු කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිවයුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද රජයේ ගිණුමට අදාල වව්චර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා අනුව ඇප තබා නොතිබුණි.
(ඇ) මුදල් රෙගුලාසි 881	ඇප තැබිය යුතු තනතුරකට නිලධාරියෙකු පත්කිරීමේදී හෝ එවැනි තනතුරකට මාරු කිරීමේදී එකී නිලධාරියා විසින් එකී තනතුරකට පත්කළ දින සිට හෝ මාරු කළ දින සිට දෙමසක් ඇතුලත ඇප තැබීම කළ යුතු වුවද එවැනි තනතුරුවල සේවය කරන ඇප තැබිය යුතු නිලධාරීන් කවරෙක්ද යන්න හඳුනාගෙන හෝ නොතිබුණි.
(ඈ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ II කොටසේ 9.3 වගන්තිය අනුව රජයේ මුදල් ආදියේ භාරකත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් මු.රෙ.315 විධිවිධාන	ගණන්දීමේ නිළධාරීන් ලෙස සෑම දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු විසින්ම ඇප තැබිය යුතු නිළධාරීන් විසින් ඇප තබන බවට වල බලා ගත යුතු වුවද අමාත්‍යාංශය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඉ)	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත හා පර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 1997 පෙබරවාරි 03 වැනි දින නිකුත් කරන ලද අංක 8/97 චක්‍රලේඛය සහ ආයතන සංග්‍රහයේ VIII වන පරිච්ඡේදයේ 7.1 වගන්තිය	තනතුරු 4 ක් සඳහා උපරිම සීමාව ඉක්මවා ගෙවා ඇති අතිකාල පැයගණන සඳහා සමාලෝචිත වර්ෂයට අදාලව අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

3. යහපාලනය

3.1 අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 133 හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වන වගන්තිය ප්‍රකාරව, 2022 වර්ෂය සඳහා අමාත්‍යාංශය විසින් අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා පවත්වා ගෙන ගොස් නොතිබුණි.

3.2 විගණන හා කළමනාකරණ කමිටුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වන වගන්තිය ප්‍රකාරව විගණන සහ කළමණාකරණ කමිටුවක් පත් කර රැස්වීම් පවත්වා නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ 2023 ජනවාරි 24 දිනැති නව තනතුරු ඇති කිරීම හා පුරප්පාඩු සම්පූර්ණ කිරීම යන ලිපිය අනුව අමාත්‍යාංශයෙහි අනුමත කාර්ය මණ්ඩලය 72 ක් වුවද, 2022 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයෙහි තත්‍ය කාර්ය මණ්ඩලය 55 කි. ඒ අනුව අමාත්‍යාංශයේ තනතුරු 17 ක ඌණතාවයක් පවතින බව නිරීක්ෂණය විය. තවද ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 305 ක සේවයේ යෙදී සිටින සංවර්ධන නිලධාරීන් මෙම අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයට් විගණිත දින දක්වා ඇතුලත් කර නොතිබිණි.

ඩී. එල්.ඩී. ගුණතිලක
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය – කාර්ය සාධන දර්ශක

5.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	75%-89%	50%-74%
i	අලුත්වැඩියා කරන ලද වාහන සංඛ්‍යාව		√	
ii	පුහුණුවීම් ලැබූ නිලධාරී සංඛ්‍යාව	√		

i. අලුත්වැඩියා කරන ලද යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සංඛ්‍යාව - 30.8%

ii. මිලදී ගන්නා ලද කාර්යාලයීය උපකරණ සංඛ්‍යාව - 31.6%

iii. මිලදී ගන්නා ලද යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සංඛ්‍යාව - 40.6%

iv. දක්ෂිණ අපජල සම්බන්ධතාවය අවසන් කිරීමේ ප්‍රතිශතය (වරාය නගරය සිට වැල්ලවත්ත පොම්පාගාරය දක්වා) - 20%

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම	ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබා ගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශ සීමාවන් අතර සිදු කරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම	දක්ෂිණ අපජල සම්බන්ධතාවය අවසන් කිරීමේ ප්‍රතිශතය	√		

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

ජයග්‍රහණ

1. බාහිර ජල සැපයුම් මාර්ගය (දකුණු) 90%ක් නිම කර ඇත.
2. බාහිර විදුලි සැපයුම් මාර්ගය (කි.වොට්. 220) 90%ක් නිම කර ඇත.
3. ප්‍රධාන මාර්ග සම්බන්ධතාවය (වරාය පිවිසුම් අධිවේගී මාර්ගය) 57%ක් නිම කර ඇත.
4. අභ්‍යන්තර යටිතල පහසුකම් සංවර්ධනය 75%ක් අවසන් කර ඇත.

අභියෝග

1. කොවිඩ් 19 වසංගත තත්ත්වය තුල සෞඛ්‍ය ආරක්ෂිත නියෝගවලට අනුකූලව ඉදිකිරීම් කටයුතු සිදු කරන ලදි.
2. ආර්ථික අර්බුදය හේතුවෙන් ඉදි කිරීම් ද්‍රව්‍ය හා සේවාවල අනපේක්ෂිත මිල ඉහළ යාම.
3. ආනයන සීමා කිරීම හේතුවෙන් වෙළඳපොලේ ඉදිකිරීම් ද්‍රව්‍යවල පවතින හිඟය

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	08	06	01 (අතිරික්ත)
තෘතීයික	02	01	-
ද්විතියික	36	339 *	-
ප්‍රාථමික	16	10	-
එකතුව	**62**	**356**	**01**

*අපනයන සංවර්ධන මණ්ඩලයේ කාර්යභාරය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට සංවර්ධන නිලධාරීන් 305ක් අනුයුක්ත කර ඇත.

06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

අමාත්‍යාංශ සංශෝධනය සමඟ අතිරේක ලේකම්වරයෙකු අමාත්‍යාංශයේ සේවයට වාර්තා කළ හෙයින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ සේවක සංඛ්‍යාවේ අතිරික්තයක් පවතින අතර අමතර කාර්ය මණ්ඩලය අනුමත කිරීම සඳහා කල ඉල්ලීම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා යොමු කර ඇත.

06.3 මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම*
				දේශීය	විදේශීය		
01	ධාරිතා සංවර්ධන වැඩසටහන	60	දින 01	45,649.00	-	දේශීය	සහයෝගීතාවය
02	දම්ළ භාෂා පාඨමාලාව	32	පැය 150	37,500.00	-	දේශීය	අනිවාර්ය දම්ළ පාඨමාලාව
03	උසස් MS Excel පාඨමාලාව	02	දින 01	7,000.00	-	දේශීය	Excel දැනුම
04	පරිගනක දෘඩාංග	01	මාස 06	34,050.00	-	දේශීය	පරිගනක දැනුම
05	පොදු නීතිය පිළිබඳ ඩිප්ලෝමාව	01	වසර 01	50,000.00	-	දේශීය	පොදු නීතිය පිළබඳ දැනුම
06	ධාරිතා සංවර්ධන වැඩසටහන	60	දින 01	24,300.00	-	දේශීය	සහයෝගීතාවය

***ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

1. පුහුණු වැඩසටහන් තුළින් කාර්යාල නිලධාරීන් සාමූහිකත්වය වර්ධනය වීම, සහයෝගීතාවය සමානාත්මතාවය වර්ධනය වීම තුළින් කාර්යාල දෛනික ක්‍රියාකාරකම් සරල සහ කාර්යක්ෂම වීම සිදු වේ.
2. එක් එක් විෂය පථයන් සඳහා අදාළ පුහුණු වැඩමුළු සඳහා යොමු කිරීම තුළින් එම නිලධාරීන්ගේ දැනුම වැඩිවීම තුළින් කාර්යයන් කාර්යක්ෂමව සිදු කිරීමට හැකියාව ලැබෙන අතර එමඟින් කාර්යාලය තුල රාජකාරී ඉටු කිරීම පහසු කරයි.
3. දැනුම යාවත්කාලීන වීම තුළින් ආයතනයේ කාර්ය සාධනය ඉහළ මට්ටමක පවත්වා ගත හැකි වීම.

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩි නඩි ලේඛන /පුද්ගල පඩි නඩි කාඩ්පත් පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේකය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	2022 වර්ෂයේ වෙනත් අමාත්‍යාංශයක් යටතේ සිටි බැවින් එම අමාත්‍යාංශයේ විගණන සැලැස්මට යටත්ව ඇත.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම	අනුකූල වේ		

	විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම			
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව , අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	2022 වර්ෂයේ වෙනත් අමාත්‍යාංශයක් යටතේ සිටි බැවින් එම අමාත්‍යාංශයේ විගණන සැලැස්මට යටත්ව ඇත.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල දී පිළිතුරු සපයා තිබීම	2022 වර්ෂයේ වෙනත් අමාත්‍යාංශයක් යටතේ සිටි බැවින් එම අමාත්‍යාංශයේ විගණන සැලැස්මට යටත්ව ඇත.		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	2022 වර්ෂයේ වෙනත් අමාත්‍යාංශයක් යටතේ සිටි බැවින් එම අමාත්‍යාංශයේ විගණන සැලැස්මට යටත්ව ඇත.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	2022 වර්ෂයේ වෙනත් අමාත්‍යාංශයක් යටතේ සිටි බැවින් එම අමාත්‍යාංශයේ විගණන සැලැස්මට යටත්ව ඇත.		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුල පවත්වාගෙන තිබීම	2022 වර්ෂයේ වෙනත් අමාත්‍යාංශයක් යටතේ සිටි බැවින් එම අමාත්‍යාංශයේ විගණන සැලැස්මට යටත්ව ඇත.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර්	අනුකූල වේ		

	ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම			
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අදාළ නොවේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අදාළ නොවේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර ගැනීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමා නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූලවීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කිරීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර සිටීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		

14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසිවලට අනුකූලව, රැස් කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස්කර තිබූ ආදායම්, තැම්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සිමාව තුල කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරි ලයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම.**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත් කාලීන කර පවත්වා ගෙනයාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ්අඩවිය හරහා ලබාදී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග 17.හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ යෝජනා පලකිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ	අනුකූල වේ		

	වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.			
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක 05/2008 හා 05/2008(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙක් සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

